අල්ලාහ්ගේ දූතයාණෙනි! මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අපි අපගේ පරමාධිපතිව දකින්නෙමු ද? එතුමාණෝ: “හිරු හා සඳු පැහැදිලිව තිබූ විටෙක එය දැකීමෙහි නුඹලා පීඩාවට පත්වන්නෙහු ද?” යැයි විමසූහ.

අබූ සඊද් අල් කුද්රි (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ දූතයාණනි! මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අපි අපගේ පරමාධිපතිව දකින්නෙමු ද? එතුමාණෝ: “අහස හිස්ව තිබූ විටෙක හිරු හා සඳු දැකීමෙහි නුඹලා පීඩාවට පත්වන්නෙහු ද?” යැයි විමසූහ. අපි: ‘නැත’ යැයි පැවසුවෙමු. එතුමාණෝ: “එසේ නුඹලා ඒ දෙක දැකීමෙහි පීඩාවට පත් නොවන්නාක් සේම එදින නුඹලා නුඹලාගේ පරමාධිපතිව දැකීමෙහි පීඩාවට පත් නොවන්නෙහුය.” පසුව මෙසේ පැවසීය. “නිවේදකයකු නිවේදනය කරයි: සෑම කණ්ඩායමක්ම ඔවුන් නමදිමින් සිටි දෑ වෙත පිටත්ව යයි. කුරුසයට අයත් පුද්ගලයෝ ඔවුන්ගේ කුරුසය සමග පිටත්ව යති. පිළිම වන්දනාකරුවෝ ඔවුන්ගේ පිළිම සමග පිටත්ව යති. එසේ එක් එක් දෙවිවරුන්ට අයත් පුද්ගලයින් ඔවුන්ගේ ඒ ඒ දෙවිවරුන් සමග පිටත්ව යනු ඇත. අවසානයේ දැහැමියකු හෝ වේවා නපුරෙකු හෝ වේවා අල්ලාහ් දෙවිඳාණන්ට නැමදුම් කරන්නන් හා ආගම්ලත් ජනයා අතරින් ඉතිරි වූවන් රැඳී සිටිති. පසුව අපාය ගෙන එනු ලැබ එය මිරිඟුවක් මෙන් ප්රදර්ශනය කරනු ලැබේ. එවිට යුදෙව්වන්ගෙන්: “නුඹලා නමදිමින් සිටියේ කුමක් ද? යැයි විමසනු ලැබේ. ඔවුහු: “අපි අල්ලාහ්ගේ පුත් උසෙයිර්ව නමදිමින් සිටියෙමු.” යැයි පවසති. එවිට “නුඹලා බොරු පවසා ඇත්තෙහුය. අල්ලාහ්ට කිසිදු සහකාරියක් හෝ දරුවෙකු හෝ නොවීය. නුඹලා අපේක්ෂා කරනුයේ කුමක් ද? ඔවුහු “ඔබ අපට බීමට ජලය සැපයීම අපි අපේක්ෂා කරන්නෙමු.” යැයි පවසති. එවිට, “නුඹලා පානය කරනු.” යැයි පවසනු ලැබේ. එවිට අපා ගින්නේ ඔවුන් එකිනෙකා වැටෙනු ඇත. පසුව කිතුනුවන්ගෙන්: “නුඹලා නැමදුම් කරමින් සිටියේ කුමක් ද?” යැයි විමනු ලැබේ. ඔවුහු: “අපි අල්ලාහ්ගේ පුත් මසීහ්ව නැමදුම් කරමින් සිටියෙමු.” යැයි පවසති. ඔහු: “නුඹලා බොරු පවසා ඇත්තෙහුය. අල්ලාහ්ට කිසිදු සහකාරියක් හෝ දරුවෙකු හෝ නොවීය. නුඹලා අපේක්ෂා කරනුයේ කුමක් ද? යැයි විමසයි. ඔවුහු “ඔබ අපට බීමට ජලය සැපයීම අපි අපේක්ෂා කරන්නෙමු.” යැයි පවසති. එවිට, “නුඹලා පානය කරනු.” යැයි පවසනු ලැබේ. පසුව අපා ගින්නේ ඔවුන් එකිනෙකා වැටෙනු ඇත. අවසානයේ අල්ලාහ්ව නමදමින් සිටි දැහැමියන් හා පාපතරයින් ඉතිරි වෙයි. ඔවුන්ගෙන්: “නුඹලාව රඳවා ඇත්තේ ඇයි? සැබැවින්ම මිනිසුන් ගොස් හමාරය.” යැයි විමසනු ලැබේ. එවිට ඔවුහු. “අපි ඔවුන්ගෙන් වෙන්වූයෙමු. අද අපි ඔහු වෙත වඩාත් අවශ්යතාවෙන් පසුවන්නෙමු. නිවේදකයෙක් කළ නිවේදනයට සැබැවින්ම අපි සවන් දුන්නෙමු. සෑම පිරිසක්ම ඔවුන් නමදිමින් සිටි දෑ සමග සෙන්දු විය. සැබැවින්ම අපි අපගේ පරමාධිපතිව බලාපොරොත්තුවෙන් සිටිමු.” යැයි පවසති. පසුව මහා පාලකයාණන් එහි ඔවුන් මුල් වර නොදුටු ස්වරූපයෙන් ඔවුන් වෙත පැමිණ: “මමයි නුඹලාගේ පරමාධිපති” යැයි පවසයි. එවිට ඔවුහුද “ඔබයි අපගේ පරමාධිපති” යැයි පවසති. නමුත් නබිවරුන් හැර වෙනත් කිසිවකු ඔහු සමග කතා නොකරනු ඇත. එවිට ඔහු “නුඹලා ඔහුව හඳුනන යම් සංඥාවක් නුඹලා අතර හා ඔහු අතර තිබේ ද?” යැයි විමසයි. ඔවුහු “කෙණ්ඩය” යැයි පවසති. පසුව ඔහුගේ කෙණ්ඩයෙන් නිරාවරණය කරයි. දේවත්වය විශ්වාස කළ සෑම විශ්වාසියෙකුම ඔහුට සිරස බිම තබා සුජූද් කරති. නමුත් මුහුණිච්ඡාව හා පුරසාරමට සුජූද් කරමින් සිටි අය ඉතිරි වෙයි. ඔහු සුජූද් කරන්නට ගිය ද ඔහුගේ පිට ඍජුව එක්

තට්ටුවක් මෙන් නැවත හැරී එනු ඇත. පසුව පාලම ගෙන එනු ලැබ, එය අපා ගින්න මධ්යයේ තබනු ලැබේ. අපි: “අල්ලාහ්ගේ දූතයාණනි, පාලම යනු කුමක්ද?” යැයි විමසුවෙමු. එතුමා “පාද ස්ථාවරව නොපවතින ලිස්සා යන සුළු ස්ථානයකි. යකඩින් තනන ලද යකඩ මුගුරු හා යකඩ කොකු ඇති ස්ථානයකි. එහි විශාල මුඩු කටුවක් වේ. එය නජ්ද්හි පිහිටි ‘උකයිෆා’ නම් කටු සහිතය. එය ‘සඃදාන්’ යන නමින්ද හඳුන්වනු ලැබේ. දේව විශ්වාසියා ඒ මත ඇසි පිය ගසනවාක් මෙන් ද විදුලි හඬ මෙන් ද සුළඟ මෙන් ද වඩාත් හොඳින් තරඟ වදින අශ්වයින් මෙන් ද ඔටුවන් ගමන් කරන්නාක් මෙන් ද වෙයි. එවිට ආරක්ෂාව ලබා ඉන් මිදෙන්නෙකු ද සීරීමට ලක්ව මිදෙන්නෙකු ද අපා ගින්නෙහි ගොඩ ගසනු ලබන්නෙකු ද එහි වෙයි. ඔවුන්ගේ අවසානයා ද එළියට පැමිණ පිටත්ව යන තෙක් එසේ පවතී. සත්යය සම්බන්ධයෙන් නුඹලා මට වඩාත් ආයාචනා කරමින් නොසිටිනු ඇත. සැබැවින්ම එදින පාලකයාණන් හට විශ්වාස කළවුන් කවුරුන්දැයි නුඹලාට පැහැදිලි වනු ඇත. සැබැවින්ම තමන් මිදුණු බව දුටු විට, ඔවුන්ගේ සහෝදරයින් සම්බන්ධයෙන් ඔවුහු මෙසේ විමසති. “අපගේ පරමාධිපතියාණනි, අප සමග සලාතය ඉටු කරමින් සිටි, අප සමග උපවාසය රකිමින් සිටි, අප සමග කටයුතු කරමින් සිටි අපගේ සහෝදරයෝ? යැයි විමසති. පසුව උත්තරීතර අල්ලාහ්: “නුඹලා යනු. කවර හදවතක දීනාරයක තරම් දේවත්වය පිළිබඳ විශ්වාසය තිබුණේ ද නුඹලා ඔහුව එළියට ගනු. ඔවුන්ගේ ස්වරූපය අල්ලාහ් නිරයට තහනම් කරයි. පසුව ඔවුහු ඔවුන් වෙත පැමිණෙති. ඔවුන්ගෙන් ඇතැමෙකු අපා ගින්නේ තම පාදය දක්වා ද ඇතැමෙකු තම කෙණ්ඩයේ අඩක් දක්වා ද වැසී සිටිති. ඔවුන් හඳුනන අයව ඔවුහු බැහැරට ගනිති. පසුව නැවත හැරී එති. පසුව ඔහු: “නුඹලා නැවත යනු කවර හදවතක දීනාර් භාගයක් තරම් දේවත්වය පිළිබඳ විශ්වාසය තිබෙනු නුඹලා දුටුවෙහු ද ඔහුව ද නුඹලා බැහැරට ගනු.” යැයි පවසයි. එවිට ඔවුන් හඳුනන අය ඔවුහු බැහැර කරති. පසුව නැවතත් ඔවුහු හැරී එති. පසුව ඔහු නැවතත්: “නුඹලා යනු කවර හදවතක අනුවක තරම් දේවත්වය පිළිබඳ විශ්වාසය ඇත්තේ ද නුඹලා ඔහුව ද බැහැරට ගනු.” පසුව ඔවුන් හඳුනන අයව බැහැරට ගනිති.” අබූ සඊද් තුමා මෙසේ පවසයි. නුඹලා මා සත්යය බව තහවුරු නොකරන්නේ නම් මෙම පාඨය පාරායනය කර බලනු. “නියත වශයෙන්ම අල්ලාහ් අනුවක තරම් අපරාධයක් නොකරයි. යහපතක් වී නම් ඔහු එය ගුණ කරනු ඇත.” නබිවරු, මලක්වරු හා දේවත්වය විශ්වාස කරන්නෝ මැදිහත් වෙති. එවිට මහා පාලකයාණන්, “මාගේ මැදිහත් වීම ඉතිරිව පවතී.” යැයි පවසා අපා ගින්නෙන් අහුරක් අහුරා ගනී. පසුව පිළිස්සුනු ජනයා බැහැර කොට කට අසළ ස්වර්ගය ඇති ගංගාවක හෙළනු ලැබේ. එයට ‘මාඋල් හයාත්’ ජීවත් කරවන ජලය යනුවෙන් පවසනු ලැබේ. එවිට කොළ රොඩු උසුලා ගලා යන ජලයේ බීජ හටගන්නාක් මෙන් ඒ දෙපස ඔවුන් හට ගනිති. ගල් පර්වත අසළ ද ගස් අසළ ද නුඹලා ඒවා දකිනු ඇත. ඒ අතරින් හිරුට නැඹුරුව ඇති දෑ කොළපැහැයෙන් පවතී. ඒ අතරින් හෙවණැල්ලට නැඹුරුව ඇති දෑ සුදුපැහැයෙන් පවතී. ඔවුන් මුතු මෙන් බැහැරට එනු ඇත. ඔවුන්ගේ ගෙලවල්හි රණින් වූ ගෙල මාල දමනු ලැබ
පසුව ඔවුහු ස්වර්ගයට පිවිසෙති. ස්වර්ග වාසීහු: “මොවුහු මහාකාරුණිකයාණන් විසින් නිදහස් කරනු ලැබූ අය වෙති. ඔවුන් කළ කිසිදු ක්රියාවක් හෝ ඔවුන් ඉදිරිපත් කළ කිසිදු යහපතක් හෝ හේතුවෙන් තොරව ඔහු ඔවුන්ව ස්වර්ගයට ඇතුළත් කර ඇත.” යැයි පවසති. එවිට ඔවුනට “නුඹලා දකින දෑ ද, ඒ සමගම ඒ හා සමාන දෑ ද නුඹලාට ඇතැ”යැයි පවසනු ලැබේ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

ඇතැම් සහාබාවරු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් “මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අපි අපගේ පරමාධිපතිව දකින්නෙමු ද? යැයි විමසා සිටියෝය. එවිට නබි තුමාණන් ඔවුනට: “එසේය, කිසිදු තදබදයකින් හෝ ගැටලුවකින් තොරව දහවල් මධ්යයේ හිරු දකින්නාක් මෙන් ද පුරපසළොස්වක රාත්රියේ චන්ද්රයා දකින්නාක් මෙන් ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ නුඹලා නුඹලාගේ පරමාධිපතිව දකිනු ඇත.” යැයි පැවසූහ. මෙම උපමාව පිහිටනුයේ පැහැදිලිව, සැකය දුෂ්කරත්වය හා ගැටලුවෙන් තොරව යන කරුණෙහිය. එය දැක්මෙන් දැක්මට උපමා කිරීමක් මිස ඍජු දසුනකින් දසුනක් නොවනු ඇත. මෙම දැක්ම දැහැමියන්ට හා ගෞරවය ඇත්තන්හට ස්වර්ගයේ පවතින කුසලෙහි දැක්මෙන් තොර දැක්මකි. මෙය අල්ලාහ්ට ගැතකිම් කළවුන් අතර හා ඔහු හැර වෙනත් අයට ගැතිකම් කරන්නන් අතර වෙන් කිරීමකි. පසුව අල්ලාහ්ගේ දූතයාණන්

